(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

**අංක 79.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2023 නොවැම්බර් 20 සඳුදා පූ.භා.9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

422/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණ නැවත රැකියා සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව රැකියා අහිමි වීම හේතුවෙන් එම ශ්‍රමිකයන් අතරින් යම් පිරිසකට නැවත විදේශගත වීමට නොහැකි වූ බව පිළිගන්නේද;

(iii) විදේශ රැකියා අහිමි වූ එම ශ්‍රමිකයන් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි විදේශ රැකියා නිමකර ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රමිකයන්ට බදු නිදහස් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ණය මුදලක් ලබාදීමේ වැඩපිළිවෙළ මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

438/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මෝල්ට් අඩංගු කිරිපිටි වර්ග රැසක් අලෙවි කරනු ලබන බවත්;

(ii) එවායින් සමහරක මනුෂ්‍ය ශරීරයට අහිතකර රසායනික සංයෝග අඩංගු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෝල්ට් අඩංගු කිරිපිටි නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම අමුද්‍රව්‍ය කවරේද;

(iii) එම එක් එක් අමුද්‍රව්‍ය භාවිතා කරනු ලබන අනුපාත හෝ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෝල්ට් අඩංගු කිරිපිටි පානය කිරීම හේතුවෙන් මනුෂ්‍ය ශරීරයට සිදු වන බලපෑම සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණ වාර්තා සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

693/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, කාංචිරන්කුඩා, පාවක්කොඩිචේන, පන්චේන සහ ඉලුප්පඩිචේන යන ගම්මානවලට මේ දක්වා පානීය ජල පහසුකම් ලබා දී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් එම ගම්මානවල ජීවත්වන ජනතාව පානීය ජල හිඟයකට මුහුණ දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මාන සඳහා පානීය ජල පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම ගම්මානවලට පානීය ජල පහසුකම් ලබා දෙනු ලබන කාල වකවානු කවරේද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

820/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පවුල් ඒකකයේ හා සිය දරුවන්ගේ සුරක්ෂිතභාවය සඳහා කාන්තාව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාවේ මුළු කාන්තා ජනගහණය කොපමණද;

(iii) ඒ අතරින් පාසල් යන වයසේ කාන්තා ජනගහණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මුළු පවුල් ඒකක අතරින් පියා හෝ මව නොමැති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් ඒකකවල සිටින දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ ළමා මව්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ළමා මව්වරුන් ඇතිවීමට බලපා ඇති සමාජ හා ආර්ථික සාධක කවරේද;

(iii) මෙම තත්ත්වය වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

840/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පොල්තෙල් ආනයනය කරන ලද රටවල් සහ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— 2023 නොවැම්බර් 22 බදාදා, 23 බ්‍රහස්පතින්දා, 24 සිකුරාදා, 25 සෙනසුරාදා, 27 සඳුදා, 28 අඟහරුවාදා, 29 බදාදා, 30 බ්‍රහස්පතින්දා සහ 2023 දෙසැම්බර් 01 සිකුරාදා, 02 සෙනසුරාදා, 04 සඳුදා, 05 අඟහරුවාදා, 06 බදාදා, 07 බ්‍රහස්පතින්දා, 08 සිකුරාදා, 09 සෙනසුරාදා, 11 සඳුදා, 12 අඟහරුවාදා සහ 13 බදාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2024) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2024) සලකා බැලීම සඳහා 2023 නොවැම්බර් 22 බදාදා, 23 බ්‍රහස්පතින්දා, 25 සෙනසුරාදා, 27 සඳුදා සිට 30 බ්‍රහස්පතින්දා දක්වා සහ 2023 දෙසැම්බර් 02 සෙනසුරාදා, 04 සඳුදා සිට 07 බ්‍රහස්පතින්දා දක්වා, 09 සෙනසුරාදා, 11 සඳුදා සහ 12 අඟහරුවාදා වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2024) සලකා බැලීම සඳහා වෙන් කළ 2023 නොවැම්බර් 24, දෙසැම්බර් 01 සහ 08 සිකුරාදා දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේද ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2) හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන” පනත් කෙටුම්පත (2024) සලකා බැලීම සඳහා වෙන් කළ, 2023 දෙසැම්බර් 13 බදාදා පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත — (හයවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2023 නොවැම්බර් 13) [1].

*2.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2021),— 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32(3) වගන්තිය යටතේ 2023.06.06 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.07.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*3.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා විදුලිබල මණ්ඩලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.07.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*4.

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය,— රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2021),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වගන්තිය යටතේ 2023.07.05 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය දැව සංස්ථාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, ස්වභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.07.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*5.

කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා,— 1990 සුවසැරිය පදනමේ වාර්ෂික වාර්තාව (2022),— 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම් පනතේ 19(4) වගන්තිය යටතේ 2023.09.08 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 1990 සුවසැරිය පදනමේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.10.04 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.10.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*6.

කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව (2021),— 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් පනත යටතේ 2023.04.04 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.07.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2023.06.20 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නීති ආධාර කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.07.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— බුද්ධශාසන අරමුදලේ වාර්ෂික වාර්තාව (2016 හා 2017),— 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 13 වගන්තිය යටතේ 2023.03.07 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 සහ 2017.12.31 දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බුද්ධශාසන අරමුදලේ 2016 හා 2017 වර්ෂයන්හි වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.05.23 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.18 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව (2022),— 2007 අංක 07 දරන සමාගම් පනතේ 153 වගන්තිය යටතේ 2023.08.09 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(බලශක්ති හා ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.09.07 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.09.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සැලසිනෙ රූපවාහිනි ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සැලසිනෙ රූපවාහිනි ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සැලසිනෙ රූපවාහිනි ආයතනයේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.01.05 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සැලසිනෙ රූපවාහිනි ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.02.21 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.09.07 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.10.03 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.11.10 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.03.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.03.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා පදනමේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.07.06 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා පදනමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.10.03 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.10.18 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.07.21 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.10.03 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.10.18 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.09 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.10.03 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.10.18 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.04 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*23.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*24.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*25.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*26.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*27.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*28.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*29.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.04.25 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.06.21 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*30.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2021),— 1930 (අවසන් වරට සංශෝධිත වර්ෂය 2003) අංක 10 දරන රබර් පර්යේෂණ ආඥා පනතේ 8 වගන්තිය යටතේ 2023.05.24 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*31.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 2 වගන්තිය යටතේ 2023.06.21 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.08.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*32.

ධීවර අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2020),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත යටතේ 2023.03.24 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආහාර සුරක්ෂිතතාවය හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2023.07.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.08.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*33.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 2007 අංක 07 දරන සමාගම් පනතේ 166 වගන්තිය යටතේ 2023.02.10 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.25 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.05.26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*34.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව (2019),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2022.11.24 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.04.25 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.05.26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*35.

අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2023 නොවැම්බර් 08) [1].

*36.

බෙදුම් නඩු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*37.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*38.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*39.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*40.

ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*41.

ජාතික ජලශාස්ත්‍රීය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*42.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*43.

නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*44.

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුරාවස්තු ආඥාපනත යටතේ නියෝග,— (188 වන අධිකාරය වූ) 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතේ 46 වගන්තිය සමඟ කියවිය යුතු 47(1) වගන්තිය යටතේ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 මැයි 25 දින සාදනු ලදුව, 2023.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*45.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— නීති අධ්‍යාපන සභා ආඥාපනත යටතේ රීති,— (276 අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 7 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලදුව, 2023 මැයි 15 දිනැති අංක 2332/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.07.18 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*46.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 1),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ඇතුළත් 2022 මැයි 27 දිනැති අංක 2281/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය අවලංගු කරමින් 2022 සැප්තැම්බර් 08 දිනැති අංක 2296/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*47.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 2),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 නොවැම්බර් 05 දිනැති අංක 2304/88 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*48.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 3),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*49.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග (අංක 4),— 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 18 සහ 19 වගන්ති සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*50.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ නියෝග,— 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 54(1) සහ 54(2) වගන්ති යටතේ වාරිමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 14 දිනැති අංක 2345/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*51.

මහජන ආරක්ෂක අමාත්‍යතුමා,— ආගාමික හා විගාමික පනත යටතේ නියෝග,— (351 අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වගන්තිය සමඟ කියවිය යුතු 52 වගන්තිය යටතේ මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් 2023.11.07 දින සාදන ලදුව, 2023.11.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*52.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13(1)(අ) සහ 13(1)(ආ) වගන්ති යටතේ සෙස් බද්ද සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 04 දිනැති අංක 2339/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*53.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නියෝග,— 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 20 වගන්තිය සමඟ කියවිය යුතු 26 වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 18 දිනැති අංක 2345/74 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*54.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයන් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික නිශ්චය කිරීම,— 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයින් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික, එකී පනතේ 9 වන සහ 24 වන වගන්ති ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු වන හෙයින් ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයන් වශයෙන් තිදෙනෙකු පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තන් උක්ත පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් ධුරය භාර ගැනීමට පෙර එකී තැනැත්තන් විසින් පාරිශ්‍රමික ලබන සියලු ධුර අත්හරිනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ සාමාජිකයෙකුව සිටින අතරතුර දී යම් ව්‍යාපාර කටයුත්තක නිරත වීම, යම් වෘත්තියක නියැලීම සිදු නොකළ යුතු වන හෙයින් ද;

පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කරනු ලබන තැනැත්තා රාජ්‍ය සේවයේ ද්විතීයන පදනමින් පත් කරනු ලබන අයෙකු නොවන්නේ නම්, එම තැනැත්තා අධ්‍යක්ෂ ජනරාල් ධුරය භාර ගැනීමට පෙර පාරිශ්‍රමික ලබන සියලු ධුර වලින් ඉවත් විය යුතු වන හෙයින් ද;

මෙම පනත ක්‍රියාත්මක වීමත් සමඟ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය පුළුල් වීම හේතුවෙන් එකී කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයන් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යභාරය ද වැඩි වී ඇති හෙයින් ද; සහ

එකී තනතුරුවලට පත් කරනු ලබන තැනැත්තන්ට ඉහත සඳහන් කර ඇති පරිදි වෙනත් පාරිශ්‍රමික දරන තනතුරුවලින් ඉවත් වීමට සිදු වීම සහ ව්‍යාපාර කටයුත්තක නිරත වීම හෝ යම් වෘත්තියක නියැලීම සිදු නොකළ යුතු බැවින් හා ඔවුන් විසින් සිදු කිරීමට නියමිත සුවිශේෂී කාර්යභාරය සැලකිල්ලට ගෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයින් සහ අධ්‍යක්ෂ ජනරාල් වෙත පහත පරිදි පාරිශ්‍රමික ගෙවීමට අංක අමප/23/2004/601/056 හා 2023 ඔක්තෝබර් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමතිය ලබා දී ඇති හෙයින් ද:—

(i) සභාපතිවරයාට රු.500,000.00ක් ද, සාමාජිකයෙකුට රු.450,000.00ක් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත රු.400,000.00ක් ද වශයෙන් මාසික පාරිශ්‍රමිකයක් ගෙවීම.

රජයේ සේවකයෙකු ද්විතීයන පදනම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබුවහොත්, රු.400,000.00ක පාරිශ්‍රමිකයක් හෝ එලෙස පත් කරනු ලැබූ තැනැත්තා රජයේ සේවකයෙකු වශයෙන් අවසන් වරට ලබමින් සිටි වැටුප හා දීමනාවල (ප්‍රවාහන හා සන්නිවේදන දීමනා හැර) එකතුවට සමාන පාරිශ්‍රමිකය හෝ යන දෙකෙන් වටිනාකමින් වැඩි පාරිශ්‍රමිකයක් ලබා ගැනීමට හිමිකම් ලබනු ඇත.

(ii) සන්නිවේදන දීමනාව ලෙස සභාපතිවරයාට රු.10,000.00ක මුදලක් ද, සාමාජිකයෙකුට රු.7,500.00 බැගින් හා අධ්‍යක්ෂ ජනරාල්වරයාට රු.7,500.00 බැගින් ගෙවීම.

(iii) ප්‍රවාහන දීමනා පහත පරිදි ගෙවීම් කිරීම:—

| | ඉන්ධන දීමනාව | ප්‍රවාහන දීමනාව** | රියදුරු දීමනාව** |
|---|---|---|---|
| සභාපති | ලීටර් 225 | රු. 50,000.00 | රු. 25,000.00 |
| සාමාජික | ලීටර් 200 | රු. 50,000.00 | රු. 25,000.00 |
| අධ්‍යක්ෂ ජනරාල් | ලීටර් 200 | රු. 50,000.00 | රු. 25,000.00 |

**රජයෙන් රියදුරකු සමඟ නිල වාහනයක් ලබා දිය නොහැකි අවස්ථාවලදී පමණක් ප්‍රවාහන දීමනාව හා රියදුරු දීමනාව ලබා ගැනීමට හිමිකම් ලබනු ඇත.

ඊට අනුකූලව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 9 වන සහ 24 වන වගන්ති ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයින් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉහත සඳහන් පාරිශ්‍රමික හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*55.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ඔක්තෝබර් 09 දිනැති අංක 2353/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.11.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*56.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මාර්තු 24 දිනැති අංක 2324/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.04.25 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*57.

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 3),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 2296/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.10.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

58.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

59.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

60.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

61.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

62.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

63.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

64.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

65.

හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

66.

නැගිටිමු නැගෙනහිර සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

67.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

68.

සමාධි සෞඛ්‍ය සේවා, පාරිසරික, කෘෂිකාර්මික, සංස්කෘතික හා ක්‍රීඩා මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

69.

දක්ෂිණ ලංකා තෘතියික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

70.

සහන ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

71.

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

72.

රුහුණු උද්‍යානය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

73.

"මාතර සමය" සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

74.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

75.

විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

76.

මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

77.

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

78.

විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

79.
විවාහවීමේ අවම වයස පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

80.
වෘත්තීයවේදීන්ගේ ප්‍රජා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

81.
ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

82.
ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

83.
දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

84.
දැදිගම ශ්‍රී මෛත්‍රී ප්‍රඥාර්ථ බෞද්ධ අධ්‍යාපන දහම් සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

85.
සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---